නොවන බවත්, නිර්වාණයට පත්වීමෙන් අනතුරුව නිර්වෘතියට ද පත්විය යුතු බවත් පැහැදිලිව ම ප්‍රකාශ කර තිබේ. බුද්ධතා, තථතා, භූතකෝටි, ධර්මකාය, පරිනිෂ්පන්න, ශූන්‍යතා, ධර්මධාතු ආදී වාග් මාලාවට සර්වඥතාව නම් වූ සම්‍යග් සම්බුද්ධත්වය වෙත කේන්ද්‍ර ගත කරමින් එහි ස්වරූපයම සසර පැවැත්මේ පරිපූර්ණ නැවැත්ම ලෙස විග්‍රහ කරන අයුරු පෙනේ.

මෙලෙස හීනයාන හා මහායාන වූ චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායය නිර්වාණය පිළිබඳව සිය අභිමතයන්ට අනුව කරුණු දක්වා ඇති බවක් පෙනේ. බුද්ධ භාෂිත ධර්මය විවරණය කිරීමේ දී ද මෙම ක්‍රමවේදය ම භාවිත කොට ඇත. කිනම් මතිමතාන්තර ඉදිරිපත් කොට විවිධ නාමයන්ගෙන් නිර්වාණය හැඳින්වුව ද සසර දුක් නිමා කොට සැනසුමට පත්වීම නිර්වාණය ලෙසින් පිළිගත යුතු වේ. නිර්වාණය ප්‍රාප්තිය ලිඛිත හෝ වාචික වචනයන්ගෙන් විස්තර කළ හැකි ද නොවේ.



# බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් ශ්‍රී ලංකාවේ මූලායතනයන්හි වැදගත්කම: 13 සියවස දක්වා*

ආචාර්ය ආර්.එච්.අයි.එස්. රණසිංහ

අනුරාධපුර යුගයේ දී ප්‍රධාන බෞද්ධ නිකායන් වූ මහාවිහාර, අභයගිරි හා ජේතවනයට සම්බන්ධව දිවයිනේ ප්‍රධාන ආරාම අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස මූලායතන පැවතුණි. පිරිවෙන්හි වඩාත් දියුණු අවස්ථාවනට පත් වූ විද්‍යාස්ථාන වශයෙන් මූලායතන සලකනු ලැබිය. මහාවිහාරයට සම්බන්ධව ගල්තුරුමූල (සේලන්තර මූල) සහ විල්ගම්මූල (සරෝගාමමූල) ද, අභයගිරියට සම්බන්ධව උතුරු මූල, කපාරමූල, මහනෙත් පාමූල සහ වහදූමූල ද, ජේතවනයට සම්බන්ධව දකුණුමූල සහ සෙනෙවිරද්මූල යනුවෙන් මූලායතන අටක් තිබුණි. මෙම සෑම ආයතනයක්ම මහතෙර නමකගේ නායකත්වයෙන් සංවිධානය වී තිබෙන්නට ඇතිබව ඉතිහාසඥයින්ගේ මතයයි. සංඝ සමසාජයේ ප්‍රධාන සංවිධාන මෙන්ම අධ්‍යාපන මධ්‍යස්ථාන වූවා පමණක් නොව, ඉඩම් සහ ගම් ඇතුළත් දේපල හිමි මණ්ඩල ද වූ බව ඒ පිළිබඳ නීති පනවා තිබීමෙන් සනාථ වේ.

අනුරාධපුර යුගයෙහි පශ්චිම භාගයෙහි වර්ධනය වූ, මෙරට ශාසනික සහ අධ්‍යාපනික උන්නතියට අගනා සේවයක් කරන ලද්දාවූ

* © ආචාර්ය ආර්. එච්. අයි. එස්. රණසිංහ
ආචාර්ය උදිත ගරුසිංහ (ප්‍රධාන)
වල්පොල පියරතන හිමි, ගල්ලෙලකුඹුල්ලේ සරණංකර හිමි, සහාය සංස්කාරක
2007 සාරදා, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ශාස්ත්‍රීය සංග්‍රහය,
කැලණිය විශ්වවිද්‍යාලය, පිටු 223 - 229

මෙම මූලායතන අභ්‍යන්තර අරගල සහ විදේශ ආක්‍රමණ හේතුවෙන් පරිහානියට පත් වුවද, විනාශයට යා නොදී භික්ෂූන් වහන්සේලා විසින් අප්‍රතිහත ධෛර්යයෙන් රැකගෙන ඇති බව පොළොන්නරු යුගයෙහි ආරම්භයෙහිම අෂ්ට මූලායතන ගැන සඳහන් වීමෙන් පැහැදිලි වේ. සොළී පාලනය මර්දනය කර පොළොන්නරු රාජධානිය පිහිටුවාගත් I විජයබාහු (ක්‍රි.ව.1055 -1100) රජුගේ කාලයේ සිටම මෙම ආයතන ඒකිනෙකට වෙනස් මතවාද සහිතව වර්ධනය වී ඇත. එම කාලයේ දේශපාලන, ආගමික සහ අධ්‍යාපනික ක්ෂේත්‍රයේ බෙහෙවින් වැදගත් ආයතන වූවා පමණක් නොව, භික්ෂූන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් සිටි බවද සැලකිය හැකිය. විජයබාහු රජුගෙන් පසුව සිංහාසනයට හිමිකරු තීරණය කිරීමේ රාජසභාවේදී අෂ්ටායතනය භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛත්වයක් දරා ඇත.[1] එබැවින් I විජයබාහු (ක්‍රි.ව. 1111 - 1132) රජු විසින් කරනු ලැබුවාවූ විහාර දේපල රාජ සන්තක කිරීමේ පිළිවෙතට විරෝධය පාමින් වශයෙන් මූල විහාර නමින් හැඳින්වූ සංඝ්‍යා අටක භික්ෂූන් දළදා පාත්‍රා රැගෙන රෝහණයට ගොස් ඇත.[2] I පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1153 - 1186) රජු ජේතවනාරාම භූමියෙහි අෂ්ට මූලායතනයන්ට අයත් හිමිවරුනට ප්‍රාසාද අටක් තනවා දී ඇත.[3] මේ අන්දමට සියලුම මූලායතන පොළොන්නරු යුගයෙහි ක්‍රියාකාරී තත්වයෙන් පැවති බවද එමගින් බුදු සසුන සහ අධ්‍යාපනයට විශිෂ්ට සේවයක් සිදුවූ බව ද නිසැකය.

අනුරාධපුර පශ්චිමභාගයේදී මහාවිහාරය අභිභවා ඉදිරියට ගිය අභයගිරියට අයත් වූ සිව් මූලායතනයන්ගෙන් වැදගත් කාර්ය භාරයක් ඉටු වූ අතර, ඒ අතුරින් කපාරාමූල සහ උතුරු මූලයන් ප්‍රධාන විය. මෙම ආයතන දෙක අනුරාධපුර මෙන්ම පොළොන්නරු යුගයේ ද වැදගත් සහ ජනප්‍රිය ආයතනයක් ලෙස තිබී ඇත. එසේම පොළොන්නරු යුගයෙහිදී ප්‍රමුඛත්වය ලැබුනේ නිකායන්ට නොව මූලායතනයන්ට බව මේ අනුව පැහැදිලි වේ.

1. මහාවංශය. 60: 1- 4.
2. මහාවංශය. 61: 59 - 60.
3. පූජාවලිය. සංස්. පඤ්ඤාලෝක හිමි. 1986, 783 පිටුව.



අභයගිරියට අයත් ප්‍රථම මූලායතනය වශයෙන් සැලකෙන කපාරාමූලය හත්ථදාඨ නම් වූ II දාඨෝපතිස්ස (ක්‍රි.ව. 659 - 667) රජ කරවූ කපුරු පිරිවෙන මුල්කර ඇතිවිය.[1] I සේන (ක්‍රි.ව. 833 - 853) රජු මහ ඈපා වශයෙන් සිටි කල්හි, මේ පිරිවෙනට ගොඩනැඟිල්ලක් තනා පූජා කර ඇත.[2] මහාකපාර සහ කුඩාකපාර යනුවෙන් පිරිවෙන් දෙකක් IV කාශ්‍යප (ක්‍රි.ව. 898 - 914) රජු ඉදිකරවා ඇත.[3] පසු කාලයේ මහත් ප්‍රසිද්ධියට පැමිණි කපාරාමූලය අභයගිරි නිකායේ උසස් විද්‍යාස්ථානයක් බවට පත්විය. V කාශ්‍යප (ක්‍රි.ව. 914 - 923) රජුගේ කාලය වන විට කපාරාමූලය විශාල ආයතනයක් බවට පත්ව තිබූ බව එතුමාගේ අනුරාධපුර පුවරු ලිපියෙන් සනාථ වේ.[4] එහි ආරාමයන්හි අභ්‍යන්තර සහ බාහිර පාලනය පිළිබඳ නීතිරීති මෙන්ම, පැවිදි කිරීම පිළිබඳ නීතිරීති ද අන්තර්ගත වේ. මෙලෙස නීතිරීති පැනවීමට අවශ්‍ය වූයේ විශාල ආයතනයක් වශයෙන් තිබූ හෙයින් බව නොඅනුමානය. අභයගිරි විහාරයෙන් හමුවූ කපාරාම සංස්කෘත ලිපයේ අන්තර්ගත වූ කපාරාමූලයේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා ජල පහසුකම් සැපයීම[5] පිළිබඳ කරුණු වලින්ද සනාථ වනුයේ භික්ෂූන් විශාල සංඛ්‍යාවක් සිටි බව මෙන්ම, ක්‍රමවත් පාලනයක් ද එහි වූ බවයි. පොළොන්නරු යුගය ආරම්භයේ සිටම රාජකීය අනුග්‍රහය ලත් බව I විජයබාහු රජුගේ යශෝධරා නැමැති දූ කුමරිය කපාරාමූලයට පිරිම ගෙයක් තනවා පූජා කිරීමෙන් පැහැදිලි වේ.[6]

අභයගිරියට අයත් වැදගත්ම මූලායතනය වශයෙන් සැලකිය හැකි උතුරුමූලය ඇරඹුනේ උත්තරෝල පිරිවෙන මුල්කරගෙනය. මානවම්ම (ක්‍රි.ව. 684-718) රජු විසින් ඇසක් අහිමි වූ හෙයින් පැවිදි වූ තම දෙටු සොයුරා වෙනුවෙන් උත්තරෝල පිරිවෙන කරවා, භික්ෂූන් වහන්සේලා හයසිය දෙනෙකුගේ ප්‍රධානියා වශයෙන් උන්වහන්සේ

1. මහාවංශය. 43: 28.
2. මහාවංශය. 50: 77.
3. පූජාවලිය. 781 පිටුව.
4. EZ. Vol.I.pp.41-57.
5. EZ.Vol. V. pp. 168-169.
6. මහාවංශය. 60: 84-85.
7. මහාවංශය. 57: 21-23

පත් කළේය.[1] රජ පෙළපතට අයත් අයෙකුගේ නායකත්වයද, මහත් භික්ෂූන් සංඛ්‍යාවක් සහිතව වූ ආරම්භය ද නිසා, රාජධානියේ අගනාම සම්පත වූ දළදාවේ භාරකාරත්වය ද[1] ලද හෙයින් උතුරුමූළ ආරම්භයේ සිටම බලවත් ආයතනයක් වශයෙන් පැවතුණි. I සේන (ක්‍රි.ව. 833-853) රජු ස්වකීය නමින් මෙහි භික්ෂූන්ට ආවාසයක් ද[2], සේන (ක්‍රි.ව. 853-857) රජු ප්‍රාසාදයක් ද ඉදිකරවා පූජා කර ඇත.[3] I විජයබාහු රජු දළදා පාදා දෙක සහ මහා ශිලා බුදුපිළිමය තැන්පත් කිරීමට තැන වූ දළදා මාළිගයේ භාරකාරත්වය ද හිමිව තිබීමෙන් සැලකිය හැක්කේ උතුරුමූලය පොළොන්නරු යුගය ආරම්භයේ සිටම වැදගත් මූලායතනයක්ව තිබූ බවයි. විජයබාහු රජුගේ කාලයෙහි මෙම ආයතනය දේශපාලන, ආගමික සහ අධ්‍යාපනික ක්ෂේත්‍රයේ බෙහෙවින් වැදගත් ආයතනයක් විය. එවකට උතුරුමූළයේ ප්‍රධානියා වූයේ මොග්ගල්ලාන හිමිය. උන්වහන්සේ ආගම් සහ ශාස්ත්‍ර පිළිබඳව වියත් පඬිවරයෙකු වූ බැවින් මෙම මූලය භික්ෂූන් විශාල සංඛ්‍යාවකින් සමන්විත උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවතින්නට ඇති බව නොඅනුමානය. I වික්‍රමබාහු රජු ශාසන විරෝධී ක්‍රියාවන් කරන කල්හි දළදා ආරක්ෂාකිරීමේ කාර්යය වේළයික්කාර සේනාංකයට උන්වහන්සේ විසින් පැවරූ බව වේළයික්කාර ලිපියේ සඳහන් වේ.[4]

මානවම්ම (ක්‍රි.ව.684-718) රජු විසින් මහා කාපාරාව ආසන්නව වාහකදීප නම් ස්ථානයේ කරවූ පිරිවෙන ද,[5] වහදූමූල නමින් අභයගිරියට අයත් මූලායතනයක් ලෙස දියුණු විය. VI අග්බෝධි (ක්‍රි.ව. 733-772) රජු ප්‍රාසාදයක් ද[6], II දප්පුල (ක්‍රි.ව. 815-831) රජු සේනග්ග බෝධි සැය ද[7] මෙම මූලායතනය සඳහා කරවීමෙන් පැහැදිලි වනුයේ රාජානුග්‍රහය නොමදව ලත් බවයි. V කාශ්‍යප රජුගේ අනුරපුර පුවරු ලිපියෙන් පැනවූ ව්‍යවස්ථාමාලාවේ මහනෙත් පා වහදූ දෙඅවසටද් මෙ සිරිත්

1. දළදා සිරිත. සංස්. ඊ.එස්. රාජසේකර.1920.46 පිටුව.
2. මහාවංශය. 50:77.
3. මහාවංශය. 51: 76-77.
4. EZ. Vol.II. pp. 242-255.
5. පූජාවලිය. 780 පිටුව
6. මහාවංශය. 46(48):66.
7. මහාවංශය. 49:33.



කරනු ඉසා[1] යනුවෙන් සඳහන් කිරීමෙන් සැලකිය හැකි වනුයේ එවකට ප්‍රධාන ආයතනයක් ලෙස මෙය පැවති බවයි.

මානවම්ම රජු විසින් අභයගිරි භික්ෂූන්ට පිදූ මහානේත්‍රප්‍රාසාද නම් වූ ආවාසය ද[2] මහනෙත් පාමුළ නමින් අභයගිරියට අයත් මූලායතනයක් ලෙස වර්ධනය විය. V කාශ්‍යප රජුගේ අනුරපුර පුවරු ලිපියෙන් පැන වූ ව්‍යවස්ථා මාලාව මහනෙත්පාමුලයට ද පොදු විය. ඒ අනුව මෙම මූලයද ධර්ම ශාස්ත්‍රාලෝකය පතුරුවාලූ මහා විද්‍යාස්ථානයක් වශයෙන් පවතින්නට ඇති බව නොඅනුමානව. මෙම ආයතනය පොළොන්නරු යුගයෙහි ද විද්‍යාස්ථානයක් ලෙස තිබූ බව I විජයබාහු සහ I පරාක්‍රමබාහු රජුන්ගේ කාලයන්හි අෂ්ඨ මූලායතනයන් පිළිබඳව සඳහන් වීමෙන් පැහැදිලි වේ.

II දාඨෝපතිස්ස (ක්‍රි. ව. 659 - 677) රජු ස්වකීය මුණුපුරු හිමිනමක් සඳහා තනවා පිදූ අරම ගලතුරුමූළ නමින් මහාවිහාරයට අයත් මූලායතනයක් ලෙස වර්ධණය විය.[3] පොළොන්නරු යුගයෙහි ප්‍රධාන අධ්‍යාපන ආයතනයක් වශයෙන් ගලතුරුමූලය පැවති බව I විජයබාහු රජුගේ මෙන්ම I පරාක්‍රමබාහු රජුගේ ද අනුග්‍රහය ලැබීම අනුව සැලකිය හැකිය. I විජයබාහු රජුගේ බිසව මෙම මූළයට මහා ප්‍රාසාදයක් තනවා ඇත.[4] I පරාක්‍රමබාහු අවධිය වන විට මෙය රුහුණේ පිහිටි ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානය විය. එතුමා කරවන ලද සංඝ සංශෝධනයට රුහුණේ භික්ෂූන් වෙනුවෙන් පෙනී සිටීමට ගලතුරුමූළයේ නන්ද හිමියන්හට ඇරයුම් ලැබුනේ එහෙයිනි.[5] උන්වහන්සේ ආගම් හා ශාස්ත්‍ර පිළිබඳව වියත් පඬිවරයෙකු විය. දඹදෙණි යුගයේ රචිත වුත්තෝදයෙහි කතුවරයා වූ සංඝරක්ඛිත හිමිගේ ගුරුවරයා වූයේ ගලතුරුමූළයේ සීල හිමි වීමෙන් ද පැහැදිලි වනුයේ එවකට ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බවයි.[6]

1. EZ. Vol. I. p. 45.
2. මහාවංශය. 45 (48): 2.
3. මහාවංශය. 57: 33-40.
4. මහාවංශය. 60: 85.
5. මහාවංශය 78:10.
6. වුත්තෝදය. සංස්. ලබුගම ලංකානන්ද හිමි, 1946. 11 පිටුව.

මහාවිහාරයට අයත් සේ සලකන වෙල්ගම්මූල, සරසිගාමමූල, සරෝගාමමූල යනුවෙන් හැඳින්වෙන විල්ගම්මූලයේ ආරම්භක ස්ථානය වශයෙන් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ස්ථාන ගණනාවක් පිළිබඳව මතවාදයක් පවතී. විල්ගම්මූල පොළොන්නරු යුගයෙහි ප්‍රධාන අධ්‍යාපන ආයතනයක් විය. මෙම මූලයට අයත් භික්ෂූහු සාහිත්‍ය ආගමික කටයුතුවල විශිෂ්ටත්වයක් ලද්දෝ වූහ. පාලි ශබ්දකෝෂයක් වූ අභිධානප්පදීපිකාවේ කර්තෘ වූ මුගලන් හිමි විල්ගම්මූලයට අයත් වන අතර උන්වහන්සේ එම කෘතිය ලියනු ලැබුයේ I පරාක්‍රමබාහු රජු විසින් ජේතවනාරාමයේ තනවනු ලැබූ විල්ගම්මූලයටඅයත් ප්‍රාසාදයේ වෙසෙමිනි.[1] මුගලන් හිමි ආගමික මෙන්ම සාහිත්‍ය කටයුතුවලද්ද විශිෂ්ටත්වයක් ලද්දෙකු වූ බැවින් විල්ගම්මූලය අධ්‍යාපන කටයුතු සඳහා විශිෂ්ට මූලයක් ලෙස පැවතුන බව නිසැකය.

ජේතවන නිකායට අයත් දකුණුමූල ලෙස සංවර්ධනය වූයේ වලගම්බා (ක්‍රි.පූ.89-77) රජුගේ උත්තිය ඇමති තනවා අභයගිරි විහාරයට පූජා කරන ලද දක්ඛිණ විහාරයයි.[2] ගෝඨාභය (ක්‍රි.ව.253-266) රජුගේ කාලයේදී දක්ඛිණ විහාරයේ භික්ෂූන් අභයගිරිය ඇදහූ වෛතුල්‍යවාදය අතහැර සාගලිකවාදය පිළිගෙන ජේතවනයට සම්බන්ධ වූ බැවින් දක්ඛිණ විහාරය ජේතවනයට අයත් දකුණු මූලය බවට පත්විය. එසේම පොළොන්නරු යුගයෙහි මහත් සංවර්ධනයට පත්ව තිබූ ජේතවනාරාමයෙහි මූල බීජයන් ඇතිවූයේ අනුරාධපුර යුගයේ පැවති ජේතවන නිකායෙන් බව සලකන හෙයින්, පුළුල් අධ්‍යාපන පාඨමාලාවන්ගෙන් ද, වියතුන්ගෙන් ද සමන්විත වූ අධ්‍යාපන මධ්‍යස්ථාන මෙම මූලයට සම්බන්ධව තිබෙන්නට ඇති බව නොඅනුමානය.

III අග්ගබෝධි (ක්‍රි.ව.633-643) රජුගේ අමාත්‍ය පොත්ථසාත තනවන ලද සේනාපතිරාජ පිරිවෙන මුල්කර ඇති වූ සෙනෙවිරද්මූල ද ජේතවනයට අයත් විය. ජේතවනාරාම විහාර භූමියේ තිබී සොයාගත්

1. අභිධානප්පදීපිකාව හෙවත් පාලි නිඝණ්ඩුව. සංස්. වැලමේ පියරතන හිමි. 1996.
2. මහාවංශය, 33-89-90.
3. වංසත්ථප්පකාසිනී මහා වංසටීකාව. අනු. ධම්මකුසල හිමි. 1975.123 පිටුව.



IV මහින්ද (ක්‍රි.ව.956-972) රජුගේ සමයට අයත් පුවරු ලිපියකින් ඒ බැව් සනාථ වේ. එක්තරා 'පැන් මණ්ඩපයක' භාවිතය පිළිබඳව රත්නමා පිරිවෙනේ සහ සෙනෙවිරද්මූලයේ වාසය කරන්නන්ට පැන වූ විධි විධාන එම ලිපියේ අන්තර්ගතය.[1]

මෙම සාධක අනුව මහාවිහාරය, ,අභයගිරි සහ ජේතවන නිකායන්ට සම්බන්ධව ආරම්භ වූ අෂ්ට මූලායතනයන්ගෙන් අනුරාධපුර යුගයේ මෙන් ම පොළොන්නරු යුගයේ දී ද අගනා අධ්‍යාපනික මෙහෙවරක් ඉටු වූ බව ද, ඒ සඳහා රාජකීය මෙන් ම ප්‍රභූඅනුග්‍රහය නොමඳව ලැබූ බව ද පැහැදිලි ය.

1. EZ.Vol. III. pp.226-229.